පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : 79

ආයතනයේ නම :- දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

පාර්ලිමේන්තුවේ රජයේ ඉණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 (4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் - 79

நிறுவனத்தின் பெயர்:- மாவட்ட செயலகம் அம்பாறை

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4)இன் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Parliamentary Series No: 79

Name of the institution: - District Secretariat Ampara

Submission of observation of Hon. Minister and Steps taken with regard to the reports tabled by the Committee on public Accounts in terms of Standing Order No.119 (4)

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද ස්ථාවර වත්කම් නියෝග 119(4) සම්බන්ධයෙන් නිරීක්ෂණ හා ගනු ලබන පියවරයන් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 79

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර

රා.ගි.කා.සභාව විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු හා මඟපෙන්වීම්	ගණන්දීමේ නිලධාරී විසින් ගත් ක්‍රියාමාර්ග	වර්තමාන ප්‍රගතිය
පළමු කොටස : 82.00 i. අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	අනවසර අල්ලා ගැනීම් පිළිබඳ ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත.	ඒ අනුව කටයුතු කරමින් පවතී
ii. දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	දීර්ඝ කාලීන බලපත්‍ර නිකුත් කිරීමේ ලේඛණය යාවත්කාලීනව පවත්වාගෙන යන ලෙස ප්‍රාදේශීය ලේකම්වරු දැනුවත් කර ඇත.	ඒ අනුව කටයුතු කරමින් පවතී
iii. වියදම් උපයෝගිතා ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	වියදම් උපයෝගිතා ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත.	ඒ අනුව කටයුතු කරමින් පවතී
iv. අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා නැත.	අවදානම් ලේඛණය යාවත්කාලීනව පවත්වා ගෙන යන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	ඒ අනුව කටයුතු කරමින් පවතී
v. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නැත.	වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	2023 වර්ෂයේ සිට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.
vi. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නැත.	වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	2023 වර්ෂයේ සිට ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර ඇත.
vii. විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයා නොතිබුණි.	විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර තිබූ සෑම විගණන විමසුමක් සඳහාම මසක් තුළ පිළිතුරු සපයන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	ඒ අනුව කටයුතු කරමින් පවතී
viii. සියලු වාහනවල අයිතිය තහවුරු කරන ලිපි සන්තකයේ නොමැත.	වාහනවල අයිතිය පවරා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශවල විරුද්ධතාවයක් නොමැති බවට එකඟතාවය ලබා ගැනීම සඳහා 2023.09.12 දින රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ට ලිපියක් යවා ඇත. (ඇමුණුම I) එම ලිපියට පිළිතුරු රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ 2023.12.07 දින ලිපිය මඟින් දැනුම් දී ඇත. (ඇමුණුම II.) එම වාහනවල අයිතිය පුනරුත්ථාපන අමාත්‍යාංශය සතුව ඇති අතර එම අමාත්‍යාංශයට අදාළ විෂය පථය වර්තමාන ආරක්ෂක අමාත්‍යාංශය යටතේ නිබෙන බව පසුගිය විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී සඳහන් කර ඇති නිසා වර්තමාන ආරක්ෂක අමාත්‍යාංශයේ සහාය ලබා ගැනීම සඳහා ලිපියක් (2024.01.04) යවා ඇත. (ඇමුණුම III)	ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ දැනුම්දීමට අනුව මෙම වාහනවල ලියාපදිංචි අයිතිය පවරා ගැනීම සඳහා 2024.03.11 දිනැතිව ඉල්ලීමක් අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. (ඇමුණුම V.)

	මෙම වාහනවලට අදාළ ගොනු ආරක්ෂක අමාත්‍යාංශයේ නොමැති බවත් පුනරුත්ථාපන විෂයට අදාළ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය අධිකරණ අමාත්‍යාංශ විෂය පථයට අයත් වන බව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ 2024.02.26 දිනැති ලිපිය මඟින් මා වෙත දැනුම් දී ඇත. (ඇමුණුම IV.)	
ix. වාහනයක් ගර්හිත වී මාස 8ට අඩු කාලයකදි අපහරණය කර නොතිබුණි	දැනට ලියාපදිංචි අයිතිය ඇති වාහන 07 ක් වෙන්දේසි කිරීම සඳහා 2024.03.13 දිනැතිව ප්‍රසම්පාදන මණ්ඩලයක් පත්කර ඇත.	ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.
x. පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත	පොදු තැන්පත් ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර ඇත
xi. 2017.09.20 දිනැති අංක 04/2014 දරන කලමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කාර්ය මණ්ඩල තොරතුරු කාර්තුවක් අවසන් වී මාසයක් ඇතුලත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	අදාල වාර්තා නියමිත කාලවකවානු අනුව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.	ඒ අනුව කටයුතු කර ඇත.
දෙවන කොටස :77.50		
i. මාසිකව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	රටෙහි පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කිරීමට සිදුව තිබුණි.	දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම මාසිකව පැවැත්වීමට කටයුතු කරමින් ඇත
ii. දිස්ත්‍රික් ලේකම් විසින් කැඳවනු ලබන ප්‍රාදේශිය ලේකම් සමුළුව මාසිකව පවත්වා නොතිබුණි.	රටෙහි පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කිරීමට සිදුව තිබුණි.	ප්‍රාදේශිය ලේකම් සමුළුව මාසිකව පැවැත්වීමට කටයුතු කරමින් ඇත
iii. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම් මාසිකව පවත්වා නොතිබුණි.	රටෙහි පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කිරීමට සිදුව තිබුණි.	දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු රැස්වීම මාසිකව පැවැත්වීමට කටයුතු කරමින් ඇත
iv. දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු මාසිකව රැස්වී නොතිබුණි.	රටෙහි පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කිරීමට සිදුව තිබුණි..	දිස්ත්‍රික් මිල නියම කිරීමේ කමිටු රැස්වීම මාසිකව පැවැත්වීමට කටයුතු කරමින් ඇත
v. 2018.01.24 දිනැති අංක 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය නිසි පරිදි පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සකස් කර ඇත	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි ක්‍රියාත්මක කරමින් පවතී
vi. ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධික්ෂණය කිරීමට හෝ ඇගයුම් කිරීමට ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි	ආයතනයේ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය ක්‍රියාත්මක වීම පිළිබඳ අධික්ෂණය කිරීම පරිපාලන නිලධාරී වෙත පවරා ඇත.	පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය නිසි පරිදි ක්‍රියාත්මක කරමින් පවතී

vii. 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන අනුව නිසි පරිදි සකස් කරනු ලැබූ මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.	2023 වර්ෂයේ සිට සකස් කර ඇත.
viii. සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගනුව නොතිබුණි.	.....	2023.11.30 දිනැති අංක 02/2018 (I) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් කාර්යය සාධන ගිවිසුම් සකස් කිරීම අවලංගු කර ඇත.
ix. දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම් කාර්තුවකට වරක් රැස්ව නොතිබුණි.	රටෙහි පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කිරීමට සිදුව තිබුණි.	දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මත්ද්‍රව්‍ය නිවාරණ කමිටු රැස්වීම කාර්තුමය වශයෙන් පැවැත්වීමට කටයුතු කරමින් ඇත
x. සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබාදී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට අඩු මට්ටමේ පැවතුණි.	රටෙහි පැවති ඉන්ධන අර්බුදය හා ආර්ථික අර්බුදය හේතුවෙන් පුහුණු වැඩසටහන් සඳහා කැඳවීම සීමා කිරීමට සිදුව තිබුණි.	2023 වර්ෂයේ සිට සකස් කළ මානව සම්පත් සංවර්ධන සැලැස්මට අනුව ප්‍රශස්ථ සීමාව දක්වා අදාළ පුහුණු වැඩසටහන් සැලසුම්කර ක්‍රියාත්මක කරමින් පවතී.
xi. උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරීන් නිසි පරිදි ස්ථාන මාරු කර යැවීමට කටයුතු කර නොතිබුණි.	පැවති ඉන්ධන හා ආර්ථික අර්බුදය හේතුවෙන් නිලධාරීන් ස්ථාන මාරු කිරීම අවම මට්ටමකින් සිදු කිරීමට සිදු විය.	චක්‍රලේඛ විධිවිධාන පරිදි වාර්ෂික ස්ථාන මාරු කිරීම් නිසි පරිදි සිදුකිරීමට පියවර ගෙන ඇත.
xii. දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 2කට වරක් රැස්ව නොතිබුණි.	රටෙහි පැවති ඉන්ධන අර්බුදය, ආර්ථික අර්බුදය හේතුවෙන් රැස්වීම් කැඳවීම සීමා කිරීමට සිදුව තිබුණි.	දිස්ත්‍රික් පරිසර කමිටුව අවම වශයෙන් මාස 2කට වරක් පැවැත්වීමට කටයුතු කර ඇත.

දිසාපති/දිස්ත්‍රික් ලේකම්,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර

චින්තක අම්බිට්ක්‍රම
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
අම්පාර දිස්ත්‍රික්කය

ප්‍රධාන ගණකාධිකාරී,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,
අම්පාර

ඒ.එල්. මහරූෆ්
ප්‍රධාන ගණකාධිකාරී
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර

Annexure - I

41

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
மாவட்ட செயலகம் - அம்பாறை
DISTRICT SECRETARIAT - AMPARA

දිසාපති / அரசாங்க அதிபர் / Government Agent } 063 - 2222206

අතිරේක දිසාපති / மேலதிக அரசாங்க அதிபர் / Add. Gover. Agent } 063-2223553

පොදු / பொது / General } 063-2222233, 063-2222234

ෆැක්ස් / பேக / Fax } 063-2222236, 063-2222130

ඔබේ අංකය / உமது இல / Your No. }

මගේ අංකය / எனது இல / My No. } AMP/ADMN/TRANS/07/01

දිනය / திகதி / Date } 2024.03. 11

ලේකම්,
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
කොළඹ.

<u>වාහනවල ලියාපදිංචි අයිතිය පවරා ගැනීම සම්බන්ධවයි.</u>

2018.10.10 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 3/2018 2 (අ) ඡේදයේ නියමිත පරිදි අප කාර්යාලය විසින් පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය **දිස්ත්‍රික් ලේකම්, අම්පාර** නමින් පවරා ගැනීමට කටයුතු කරමින් පවතී.

02. ඒ අනුව, මේ සමඟ අමුණා ඇති වාහනවල මුල් ලියාපදිංචි අයිතිය පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යන නමින් පැවැති අතර, දැනට එම අමාත්‍යාංශය වසා ඇති හෙයින්, එම අමාත්‍යාංශයේ කොටස වර්තමානයේ ඔබගේ අමාත්‍යාංශය යටතේ තිබෙන පුනරුත්ථාපන විෂයට අදාළ වන බව 2024.02.26 දිනැති ලිපිය මඟින් ආරක්ෂක අමාත්‍යාංශය විසින් මා වෙත දැනුම් දී ඇත. එම ලිපියේ පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි.

03. එම නිසා අමුණා ඇති වාහනවලට අදාළ ගොනු ඔබ අමාත්‍යාංශයේ පවතින්නේ නම්, එම වාහනවල අයිතිය මාරු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

04 . මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

චින්තක අබේවික්‍රම
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
අම්පාර දිස්ත්‍රික්කය

පාලන/ආයතන අංශ / நிர்வாகப்/தாபன இணைப்பாளர / Admin. / Esta. } 063-2222236, 063-2222193

ගිණුම් අංශ / நிதிப்பிரிவு / Account Branch } 063-2222131, 063-2222037

ඉංජිනේරු / பொறியியலாளர் / Engineer } 063-2222608

Annexure - II

A/4338

ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE

ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

ඔබගේ අංකය / எனது இல / My No } MOD/ADM/TRA/VMT/02

ඔබේ අංකය / உமது இல / Your No }

තැ. පෙ. / த. பெட்டி / P.O. Box } 572
දුරකථන / தொலைபேசி / Telephone } 2430860-9, 2430870-8
ලේකම් / செயலாளர் / Secretary } දුර./தொ./Tel. : 011 2381154, ෆැක්ස්/தொ./Fax.: 011 2541529, ඊ. තැපෑල/மி.அ./Email : secdefence@defence.lk

දිනය / திகதி / Date } 2024.02. 26

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
අම්පාර.

දිසාපති කාර්යාලය
51
29 FEB 2024
අම්පාර

<u>වාහනවල ලියාපදිංචි අයිතිය පවරා ගැනීම සම්බන්ධවයි.</u>

යොමුව:- ඔබේ අංක AMP/ADMN/TRANS/07/01 හා 2024.01.04 දිනැති ලිපිය

ඔබගේ යොමුගත ලිපිය මඟින් වාහන 12ක තොරතුරු මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එම තොරතුරු ඉදිරිපත් කර ඇති වාහනවල මුල් ලියාපදිංචි අයිතිය පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය නමින් පැවති බවත් එම වාහන 12 දිස්ත්‍රික් ලේකම්,අම්පාර නමින් පවරා ගැනීමට අවශ්‍ය බවත් දන්වා ඇත.

02. මෙම අමාත්‍යාංශයේ ඇති ලිපි ලේඛනවලට අනුව ඔබ විසින් තොරතුරු ඉදිරිපත් කර ඇති වාහන 12ට අදාල ගොනු කිසිවක් මෙම අමාත්‍යාංශය සතුව නොමැති බව කාරුණිකව දන්වමි.

03. තවද, පුනරුත්ථාපන විෂයට අදාල පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය අධිකරණ අමාත්‍යාංශ විෂය පථයට අයත් වන බව ද වැඩිදුරටත් දන්වා සිටිමි.

ගාමිණී මහගමගේ
අතිරේක ලේකම්(පරිපාලන)
ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට.

අතිරේක ලේකම් (පරිපාලන) / மேலதிக செயலாளர் (நிர்வாகம்) / Additional Secretary (Administration) දුර./தொ./Tel. - 011 2326000 ෆැක්ස්/தொ./Fax. - 011 2446300

අතිරේක ලේකම් (ආරක්ෂක) / மேலதிக செயலாளர் (பாதுகாப்பு) / Additional Secretary (Defence) දුර./தொ./Tel. - 011 2389186 ෆැක්ස්/தொ./Fax. - 011 2441481

ප්‍රධාන මූල්‍ය නිලධාරී - I / தலைமை நிதி அதிகாரி - I / Chief Financial Officer - I දුර./தொ./Tel. - 011 2439381 ෆැක්ස්/தொ./Fax. - 011 2390720

අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන) / மேலதிக செயலாளர் (சிவில் பாதுகாப்பும் அபிவிருத்தியும்) / Additional Secretary (Civil Defence and Development) දුර./தொ./Tel. - 011 2335792 ෆැක්ස්/தொ./Fax. - 011 2335797

අතිරේක ලේකම් (පාර්ලිමේන්තු කටයුතු හා ප්‍රතිපත්ති) / மேலதிக செயலாளர் (பாராளுமன்றம் மற்.கொள்கையும்) / Additional Secretary (Parliament Affairs and Policy) දුර./தொ./Tel. - 011 2389023 ෆැක්ස්/தொ./Fax. - 011 2389022

ප්‍රධාන මූල්‍ය නිලධාරී - II / தலைமை நிதி அதிகாரி - II / Chief Financial Officer - II දුර./தொ./Tel. - 011 2421484 ෆැක්ස්/தொ./Fax. - 011 2421484

අධිකරණ ජනරාල් (සැලසුම්) / பணிப்பாளர் நாயகம் (திட்டமிடல்) / Director General (Planning) දුර./தொ./Tel. -011 2333963 ෆැක්ස්/தொ./Fax.-011 2336559

අතිරේක ලේකම් (තාක්ෂණ) / மேலதிக செயலாளர் (தொழில்நுட்ப) / Additional Secretary (Technical) දුර./தொ./Tel. -011 2333930 ෆැක්ස්/தொ./Fax.-011 2421479

Annexure - III

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
மாவட்ட செயலகம் - அம்பாறை
DISTRICT SECRETARIAT - AMPARA

දිසාපති
அரசாங்க அதிபர்
Government Agent
063 - 2222206

අතිරේක දිසාපති
மேலதிக அரசாங்க அதிபர்
Add. Gover. Agent
063-2223553

පොදු
பொது
General
063-2222233
063-2222234

ෆැක්ස්
பேக
Fax
063-2222236
063-2222130

ඔබේ අංකය
உமது இல
Your No.

මගේ අංකය
எனது இல
My No.
AMP/ADMN/TRANS/07/01

දිනය
திகதி
Date
2024.01. 04

ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය,
කොළඹ.

<u>වාහනවල ලියාපදිංචි අයිතිය පවරා ගැනීම සම්බන්ධවයි.</u>

2018.10.10 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 3/2018 2 (අ) ඡේදයේ නියමිත පරිදි අප කාර්යාලය විසින් පරිහරණය කරනු ලබන වාහනවල ලියාපදිංචි අයිතිය **දිස්ත්‍රික් ලේකම්, අම්පාර** නමින් පවරා ගැනීමට කටයුතු කරමින් පවති.

02. ඒ අනුව මේ සමඟ අමුණා ඇති වාහනවල මුල් ලියාපදිංචි අයිතිය පුනරුත්ථාපන හා සමාජ සුභසාධන අමාත්‍යාංශය යන නමින් පැවැති අතර, දැනට එම අමාත්‍යාංශය වසා ඇති හෙයින්, එම අමාත්‍යාංශයේ කොටස වර්තමානයේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යනු ලබයි.

03. එම නිසා අමුණා ඇති වාහනවලට අදාළ ගොනු ඔබ අමාත්‍යාංශයේ පවතින්නේ නම්, එම වාහන අයිතිය මාරු කිරීම සඳහා අවශ්‍ය සහාය ලබා දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි.

04. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

චින්තක අබේවික්‍රම
දිසාපති/ දිස්ත්‍රික් ලේකම්
අම්පාර දිස්ත්‍රික්කය

පාලන/ආයතන අංශ
நிர்வாகப்/தாபன இனைப்பாளர
Admin. / Esta.
063-2222236
063-2222193

ගිණුම් අංශ
நிதிப்பிரிவு
Account Branch
063-2222131
063-2222037

ඉංජිනේරු
பொறியியலாளர்
Engineer
063-2222608

Annexure - IV

R 6585

කතුරුවත්ත

(21)

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07,இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

මගේ අංකය / எனது இல / My No: PL/1/8/1/ වාහන පොදු

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2023.12. 07

දිසාපති කාර්යාලය
18 DEC 2023
අම්පාර

දිසාපති/දිස්ත්‍රික් ලේකම්,
අම්පාර.

<u>වාහන වල ලියාපදිංචි අයිතිය පවරා ගැනීම සම්බන්ධවයි.</u>

ඉහත කරුණ සම්බන්ධයෙන් ඔබගේ AMP/ADMN/TRANS/07/01 සමාංක සහිත රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කරන ලද 2023.09.12 දිනැති ලිපිය හා බැඳේ.

02. ඒ අනුව 2023.01.24 දිනැතිව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත ඔබ විසින් යොමුකර ඇති ලිපියේ සඳහන් වාහන පළාත් සභා හා පළාත් පාලන අංශය(පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය) නමින් ලියාපදිංචි වී නොමැති බව සුදුසු කටයුතු සඳහා කාරුණිකව දැනුම් දෙමි.

Trans/07/01

නිශාන්ත කරුණාතිලක
අතිරේක ලේකම් (පාලන හා පුහුණු) (වැ.බ)
පළාත් සභා හා පළාත් පාලන අංශය
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ලේකම් වෙනුවට.
දුක.අංක : 011- 2347528
ෆැක්ස් : 011- 2347532
ඊ.මේල් : admin.div@pclg.gov.lk
ලිපිනය : අංක 330, යුනියන් පෙදෙස, කොළඹ 02.

පිටපත: -
01. ලේකම්තුමාගේ සම්. ලේකම් - ලේකම් තුමා දැනුවත් කිරීම සඳහා

Annexure - V

(20)

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර
மாவட்ட செயலகம் - அம்பாறை
DISTRICT SECRETARIAT - AMPARA

දිසාපති
அரசாங்க அதிபர்
Government Agent
063 - 2222206

අතිරේක දිසාපති
மேலதிக அரசாங்க அதிபர்
Add. Gover. Agent
063-2223553

පොදු
பொது
General
063-2222233
063-2222234

ෆැක්ස්
பேக
Fax
063-2222236
063-2222130

ඔබේ අංකය
உமது இல
Your No.

මගේ අංකය
எனது இல
My No.
AMP/ADMN/TRANS/07/01

දිනය
திகதி
Date
2023.09. 12

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
නිල මැදුර,
ඇල්විටිගල මාවත,
කොළඹ 05.

<u>වාහන වල ලියාපදිංචි අයිතිය පවරා ගැනීම සම්බන්ධවයි.</u>

2018.10.10 දිනැති වත්කම් කළමනාකරණ වක්‍රලේඛ අංක 3/ 2016 2 (අ) ඡේදයෙන් නියමිත පරිදි අප කාර්යාලය විසින් පරිහරණය කරනු ලබන වාහන වල ලියාපදිංචි අයිතිය දිස්ත්‍රික් ලේකම් අම්පාර නමින් පවරා ගැනීම සඳහා අවශ්‍ය MTA 06 ආකෘතිපත්‍රය මාගේ සමාංක හා 2023.01.24 දිනැති ලිපිය මඟින් මහා භාණ්ඩාගාරයේ කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්ගේ අයිතිය පිළිබඳ අනුපිටපත සමඟ ඉදිරිපත් කර ඇත. එයට අදාළ වාහන විස්තර මේ සමඟ අමුණා ඇත.

02. කෙසේ නමුත් කොම්ප්ට්‍රෝලර් ජනරාල්ගේ අංක CGO/ASM/Vehicle Issue/DS/01/Vol-II හා 2023.04.18 දරණ ලිපිය මඟින් අයිතිය අම්පාර දිස්ත්‍රික් ලේකම්වෙත පවරා ගැනීම සම්බන්ධයෙන් එම වාහන වල වර්තමාන අයිතිකරු ලෙස සඳහන් වන ආයතන වල විෂයය පථයට අදාළ වන දැනට පවතින අමාත්‍යාංශ වල විරුද්ධතාවයක් නොමැති බවට වන නිර්දේශ ඉදිරිපත් කරන ලෙසට මාහට දැනුම් දී ඇත. එම ලිපියේ පිටපතක් මෙයට අමුණා ඇත.

03. එම නිසා අපහරණ කටයුතු සිදු කිරීම සඳහා අයිතිය පැවරීම් කටයුතු ඉතා ඉක්මනින් සිදු කළ යුතු අතර මේ පිළිබඳව විගණන දෙපාර්තමේන්තුව මඟින් විටින් විට විමසා සිටි. මෙම වාහන අවුරුදු 22 කටත් වඩා වැඩි කාලයක් අපහරණය කිරීමට තබා ඇති අතර එහි අයිතිය නොමැති බැවින් ඒ පිළිබඳ ඉදිරි කටයුතු සිදු කිරීමට නොහැකිව ඇති බව දන්වා සිටිමි.

04. එම නිසා මෙම වාහන වල අයිතිය පවරා ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ වල විරුද්ධත්වයක් පවතී ද යන්න පිළිබඳව සොයා බැලීමට අදාළ අමාත්‍යාංශ වල තොරතුරු ඔබ සතුව තිබේ නම් එම තොරතුරු මා වෙත ලබා දෙන ලෙස දන්වා සිටින අතර එසේ නොහැකි නම් අදාළ වාහන පවරා ගැනීම සඳහා විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක් ඔබ අමාත්‍යාංශය මඟින් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

චින්තක අබේවික්‍රම,
දිසාපති / දිස්ත්‍රික් ලේකම්,
අම්පාර දිස්ත්‍රික්කය

පාලන/ආයතන අංශ
நிர்வாகப்/தாபன இனைப்பாளர
Admin. / Esta.
063-2222236
063-2222193

ගිණුම් අංශ
நிதிப்பிரிவு
Account Branch
063-2222131
063-2222037

ඉංජිනේරු
பொறியியலாளர்
Engineer
063-2222608

ලේකම්තුමාගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම් විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග නිර්දේශ කරන අතර පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් සෞඛ්‍යමය අවධානය යොමු කරමින් ඒවා නිවැරදි කරන ලෙස දිස්ත්‍රික් ලේකම්ට උපදෙස් ලබා දී ඇත.

ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
(ස්වදේශ කටයුතු අංශය)
"නිල මැදුර" ඇල්විටිගල මාවත, කොළඹ 05.

ප්‍රදීප් යසරත්න

ලේකම්,

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමතිතුමාගේ නිර්දේශය හා ගෙන ඇති ක්‍රියාමාර්ග

රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දිස්ත්‍රික් ලේකම් වෙත ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් එම අඩුපාඩු නැවත ඇති නොවීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස මා විසින් අමාත්‍යාංශ ලේකම්තුමා වෙත උපදෙස් ලබා දී ඇති අතර එම ක්‍රියා මාර්ග 2024 වර්ෂය තුල දී සාධනීය මට්ටම ප්‍රශස්ත මට්ටමට ළඟා කර ගැනීමට අපේක්ෂා කරමි.

දිනේෂ් ගුණවර්ධන (පා.ම.)

අග්‍රාමාත්‍යතුමා සහ

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය